# නියාම හා කොන්දේසි

- විදේශීය සංචාරකයින් සඳහා පහත සඳහන් පරිදි ප්‍රවේශපත්‍ර නිකුත් කෙරේ.
    - විදේශීය සංචාරක -සම්පූර්ණ-Foreign Tourist Full
    - විදේශීය සංචාරක - අර්ධ-Foreign Tourist Half–(වයස අවුරුදු 06-12 දක්වා ළමුන් සඳහා)
- සිදු කරනු ලැබූ ඇණවුම, එම දින සිට දින 90 ක් දක්වා වලංගු වේ.
- ඇණවුමට අදාල ප්‍රවේශපත් අදාළ උරුම ස්ථානයේ ප්‍රවේශපත් අලෙවි කවුළුවෙන් පමණක් මිලදී ගත හැකිඅතර ප්‍රවේශපත්‍රයමිලදී ගැනීමේදී එකී ඇණවුමට අදාල ලදුපත් අංකය ඉදිරිපත් කළ යුතුවේ.
- සෑම උරුම ස්ථානයකම ප්‍රවේශපත් අලෙවි කවුළුව උදෑසන 7.00 සිට සවස 5.00 දක්වා විවෘතව පවතී.
- ප්‍රවේශපත්‍රයක් වලංගු වනුයේ අදාළ දිනය තුළ එක් ඇතුල්වීමක් සඳහා පමණි.
- ඇණවුම් කළ ප්‍රවේශපත්‍රය/ පත්‍රයන් සඳහා ගෙවූ මුදල් ආපසු ගෙවනු නොලැබේ.
- සහනදායි ප්‍රවේශපත් ලබා ගැනීම සඳහා වලංගු විදේශ ගමන් බලපත්‍රය ප්‍රවේශපත්‍රඅළෙවි කවුළුවටඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.
    - සහනදායි ප්‍රවේශපත් නිකුත් කරනුයේ,
        - SAARC රටවලට අයත් සංචාරකයින් සඳහා,
        - ශ්‍රී ලංකා රජයට හෝ තානාපති කාර්යාලයක සේවය කිරීම සඳහා මෙරට නේවාසිකව සිටීමේ අවසරයක්ඇති නේවාසික වීසා බලපත්‍ර හිමියන් සඳහා,
        - වලංගු ජාත්‍යන්තර ශිෂ්‍ය කාඩ්පත් හිමි (Green Card/ International Student Card) ශිෂ්‍යයින් සඳහාපමණි.
- අදාල බලයලත් නිලධාරීවරයෙක් විසින් ප්‍රවේශපත්‍රය උරුම භූමිය තුළ ඕනෑම ස්ථානයකදී විමසා සිටි විටඑය ඉදිරිපත් කිරීමට ඔබ බැඳී සිටී.
- ඓතිහාසික/ ලෝක උරුමයක් ලෙස නම් කර ඇති උරුම ස්ථානවල ඇතුළත් පුරාවිද්‍යා ස්ථාන වලට,සත්ත්ව හා ශාකවලට හානි කිරීම අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව දඬුවම් ලැබිය හැකි වරදකි.
- උරුම භූමීන්ට යාබදව දැඩි රක්ෂිත ලෙස නම් කර ඇති වනාන්තර ප්‍රදේශ වලට ඇතුළු වීම සඳහා මෙමප්‍රවේශපත්‍රය වලංගු නොවන බව කාරුණිකව සලකන්න.
- අපගේ ඇතැම් උරුම ස්ථාන, අභය භූමි හා ස්වභාවික රක්ෂිත තුළ පිහිටා ඇති බැවින් වන අලි, බඹරුන් වැනි වනසතුන්සම්බන්ධයෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලේ නිලධාරීන් කරනු ලබන දැනුවත් කිරීම් පිළිපැදිය යුතු වේ.
- පූජනීය ස්ථාන, පුරාවිද්‍යා උරුම භූමි තුලට ඇතුළු වීමේදී එකී ස්ථානයන්ට අදාළ, විශේෂ අණ පනත්,සම්ප්‍රදායන් සහ පිළිවෙත් කෙරෙහි අවධානය යොමු කල යුතු වේ.
- මධ්‍යම සංස්කෘතික අරමුදලේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව චිත්‍රපට, වාර්තා සහ වෙළඳ දැන්වීම් රූගතකිරීම(Filming) සිදු නොකළ යුතු අතර, ගුවනේ සිට රූගත කිරීමද (Drone Camera) නොකළ යුතුය.
- ඉහත දක්වා ඇති තොරතුරු වලට අමතරව අදාළ ව්‍යාපෘති තුළ සංචාරයේ යෙදීමේදී ගැටලුකාරී අවස්ථාවන් පැනනැගී නම් අදාළ ව්‍යාපෘති කළමනාකරු, ක්ෂණික ඇමතුම් අංකය(011-2508960) හෝ www.ccf.gov.lk වෙත පිවිසෙන්න.